**පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්ථා පවත්වා ඇති බවත්, මෙම වාර්ථාවේ 1.2 ඡේදයෙ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගණම්කරණ අඩුපාඩු

(අ) 2010 / 2011 අධ්‍යයන වර්ෂයේ පවත්වා තිබූ පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාවට සහභාවී තිබූ නිලධාරීන් වෙනුවෙන් ලැබිය යුතු රු.480,000 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන වල, එකතුව රු.58,487 ක් වූ ගිණුම් විෂයයන් 3 ක ශේෂ අඩුවෙන් දක්වා තිබූ අතර එකතුව රු.54,738 ක් වූ ගිණුම් විෂයයන් 6 ක ශේෂ වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ පරිපාලන ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා රු.15,111,237 ක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා පවරා ගෙන තිබූ ඉඩම මාස 06 ක් ඇතුළත යෝජිත ඉදිකිරීම් කටයුතු ආරම්භ නොකිරීම මත නාගරික සංවර්ධන අධිකාරිය විසින් රු.11,070,000 ක් ආපසු ගෙවා ඉඩම පවරා ගෙන තිබුණි. ඉහත ගනුදෙනුව මත නාගරික සංවර්ධන අධිකාරිය විසින් අයකර ගෙන තිබූ (ගිවිසුම් අවලංගු කිරීමේ ගාස්තු,නීතිඥ ගාස්තු මුද්දර ගාස්තු හා බදු මුදල් )

රු.4,401,237 ක ආපසු අය කර ගත නොහැකි වුවද ලැබිය යුතු ශේෂයක් ලෙස ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

1.2.2 නොසැසඳු පාලන ගිණුම්.

එකතුව රු. 5,970,578 ක් වූ ගිණුම් විෂයයන් 11 ක වියදම් හා ආදායම්වලට අදාල වු උපලේඛන/උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී රු.1,495,611 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.2.3 ලැබියයුතු ගිණුම්.

2010 වර්ෂයේදී සේවකයකුගෙන් අයවිය යුතු රු.105,957 ක් වූ අත්තිකාරම්, හිඟහිටි සේවක ණය සහ 2010 / 2011 අධ්‍යයන වර්ෂයේ උසස් ඩිප්ලෝමා පාඨමාලාවට සහභාගී වු නිලධාරීන් 06 දෙනෙකුගෙන් අය වියයුතු රු.100,000 ක මුදලක් විගණිත දින වන විටත් අයවීමට තිබුණි.

1.2.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම.

පහත ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවු සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| 1. සේවක ණය | | |
| (i) සේවක ණයගැති | 8,442 | සේවක ණයගැති ලේඛනය, ශේෂ විස්තරාත්මක උපලේඛනය |
| (ii) විවිධ ණයගැති | 17,150 | විවිධ ණයගැති ලේඛනය |
| 2. ව්‍යාපෘති ගිණුම් | | |
| (i) ඉන්ධන | 850,000 | වියදම් විභජනය කිරීමේ පදනම |
| (ii) වාහන අළුත්වැඩියා | 1,750,000 | වියදම් විභජනය කිරීමේ පදනම |
| 3. වවුචර්පත් 12 කින් ගෙවීම් | 649,703 | ගෙවීම්වලට අදාල බිල්පත් |
| 4. අගරුවු චෙක්පත් | 656,513 | අගරු චෙක්පත් උපලේඛනය |

| | | | |
|---|---|---|---|
| 5. | 2010 ජනවාරි හා පෙබරවාරි මුදල් ලැබීම් | 313,973 | කුවිතාන්සි අනු පිටපත් |
| 6. | උපචිත වියදම් | 1,685,076 | විස්තරාත්මක උපලේඛනය |
| 7. | විවිධ වියදම් | 283,707 | වවුචර් 12 ක් |
| 8. | පාවිච්චි නොකරන ලද උප පත්‍රිකා පොත් 910 | 132,525 | උප පත්‍රිකා පොත් ලේඛනය |

### 1.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූලතාවය නොදැක්වීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනත. | |
| (i) පනතේ 11 (1) ජේදය | අවම වශයෙන් සෑම මාසයකටම එක් වරක් හෝ සභාවේ රැස්වීම පවත්වනු ලැබිය යුතු වුවද, 2010 වර්ෂයේ අවස්ථා 05 කදී පමණක් රැස්වීම් පවත්වා තිබුණි. |
| (ii) පනතේ 5 (1) (ආ) ජේදය | ආයතනයේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය කිරීම සඳහා පත්කළ යුතු පාලක සභාවේ වෙනත් සමාජිකයන් යටතේ පළාත් පාලනය විෂයෙහි නියැලුනු අයෙකු සාමාජිකයෙකු ලෙස පත්කළ යුතු වුවත්, 85, 86 හා 87 වන පාලක සභා රැස්වීම සඳහා උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ (රාගම) වෛද්‍යවරයෙකු පත්කර තිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | |
|---|---|---|
| (i) | මු.රෙ. 1645 හා මු.රෙ. 1646 | සමාලෝචිත වර්ෂයේ වාහන 4 කට අදාලව මාස 8 ක හා වාහන 3 ක් සම්බන්ධයෙන් වර්ෂයටම අදාලව ධාවන සටහන් ඉදිරිපත් නොවුණ අතර ,වාහන සම්බන්ධයෙන් පොදු 267 ආකෘතිය ප්‍රකාර පොත් විධිමත්ව පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ii) | මු.රෙ. 1647 (ඉ) සහ මු.රෙ. ii කාණ්ඩයේ iv උපලේඛනය | යොමුගත රෙගුලාසි ප්‍රකාර වාහන ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (iii) | මු.රෙ. 1653 | යොමුගත රෙගුලාසියට අනනුකුල වන අයුරින් වාහන දෙකක මයිලෝ මීටර ක්‍රියාවිරහිතව තිබියදී වාහන ධාවනය කර තිබුණි. |
| (iv) | මු.රෙ. 396 | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ වලංගු කාලසීමාව ඉක්මවා තිබූ එකතුව රු.21,500 ක් වූ චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (v) | මු.රෙ. 757(2) | වර්ෂය අවසානයේදි වත්කම් භෞතිකව පරීක්ෂා කර බලා සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

(i) අංක 13/2008 හා 2008 ජුනි 26 චක්‍රලේඛය

| | |
|---|---|
| * 04 ඡේදය | අධ්‍යක්ෂක හා අතිරේක අධ්‍යක්ෂක නිල වාහන සඳහා නියම කර ඇති මූල්‍යමය |

| | |
|---|---|
| | සීමාව තුල සිය රාජකාරි අවශ්‍යතා සපුරාගත යුතු වුවද, එකී සීමාව ඉක්මවා රු.282,406 ක අතිරේක ඉන්ධන ලබාගෙන තිබුණි. නමුත් වියදම් සඳහා යොමුගත චක්‍රලේඛය ප්‍රකාර ලබා ගත යුතු අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| * 09 ජේදය | ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාහන අනුයුක්ත කර ඇති නිලධාරීන්ගේ ඉන්ධන දීමනාව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය ප්‍රකාර වියයුතු වුවද, වෙන් කර තිබූ වාහන සඳහා එවැනි අනුමැතියක් ලබාගෙන නොතිබුණි. |
| (ii) 22/99 චක්‍රලේඛය | නිල වාහන හිමි නිලධාරීන් නිවසේ සිට රාජකාරියට යාමට හා ඊම සඳහා දෙපාර්තමේන්තුවේ වාහන තිබේ නම් ඒ සඳහා ඉඩසළසා ඇතත්, ඊට පටහැනි ලෙස ආයතනයේ වාහන නොමැති අවස්ථාවල නිවාසය කරා යාමට කුලී රථ යොදා ගැනීම සඳහා රු.20,781 ක් ගෙවා තිබුණි. |
| (ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ අයිඒඅයි/2002/02 | පරිඝණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව පවත්වා ගත යුතු ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ඉ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක පීඑෆ්/පීපී/ 5 | යොමුගත චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව ව්‍යාපෘති සඳහා ලැබී තිබූ අරමුදල් |

| | | |
|---|---|---|
| | | වලින් සියලුම නිලධාරීන්ට රු.10,000 බැගින් එකතුව රු.379,166 ක් ගෙවීම් කර තිබුණි. |
| (ඊ) | 2000 මාර්තු 27 දිනැති අංක එම්එෆ්/6/1/3/200 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛය | චක්‍රලේඛය පරිදි රාජකාරි කටයුතු සඳහා විදේශගත වන නිලධාරීන්ගේ ගමන් බලපත්‍ර ගාස්තුව වෙනුවෙන් එක් අයෙකුට රු.2,500 ක ගාස්තුවක් ගෙවිය හැකි වුවත්, ඒ සඳහා රු.5,000 ක් ගෙවා තිබුණි. |
| (උ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ඩීඑම්එස්/එස්ඩීඑල්/එස්අයිඑල්ජී හා 2000 ජූලි 12 දිනැති පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය සඳහා අතිරේක කාර්ය මණ්ඩල සහ වැටුප් තලයක් අනුමත කරවා ගැනීමේ ලිපිය | යොමුගත ලිපිය ප්‍රකාර උපදේශක (නීති කටයුතු පිළිබඳ) තනතුර සඳහා නීති ක්ෂේත්‍රයේ වසර 10 ක පළපුරුද්දක් තිබිය යුතු වුවද, අදාල නිලධාරියාගේ පළපුරුද්ද සම්බන්ධයෙන් තහවුරු කිරීම විගණනයට ඉදිරිපත් නොවුණි. |

1.2.6 අධිකාරී බලය නොලත් ගනුදෙනු

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) කාර්ය මණ්ඩලය සඳහා පිහිටුවා ගෙන තිබූ සුභ සාධක සංගමය සඳහා ව්‍යාපෘති ආදායමින් 5% ක් වූ රු. 190,725 ක් අනුමැතියකින් තොරව සුභ සාධක සංගමයට ගෙවා තිබුණි.

(ආ) පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ වාහන ඇණියට අයත් නොවන වාහන 04 ක් සඳහා ඉන්ධන හා නඩත්තු වියදම් රු. 716,418 ක්ද, ආයතනයේ අරමුණුවලට අදාල නොවන කාර්යයන් වෙනුවෙන් වාහන පාවිච්චි කර ඉන්ධන සඳහා රු.179,145 ක්ද වැය කර තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,255,273 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.496,494 ක් වුයෙන්, සමාලෝචිත වර්ෂයේ දි මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,758,779 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

#### 2.1.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය සමග සැසදීමේදී සමාලෝචිත වර්ෂයෙහි මෙහෙයුම් ආදායම රු.4,349,059 කින් අඩු වී තිබුනද මෙහෙයුම් වියදම රු.6,107,838 කින් අඩ වී තිබීම මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයට හේතු වී තිබුණි.

(ආ) රජයේ දායකය රු.1,611,602 කින් අඩු වීම හා උපදේශන ගාස්තු, පාඨමාලා ගාස්තු හා අනෙකුත් ආදායම් රු.2,737,457 කින් අඩු වීම මෙහෙයුම් ආදායම අඩු වීමට බලපා තිබුණි.

(ඇ) පරිපාලන හා ආයතන වියදම් මානව සම්පත් සංවර්ධන වියදම් හා උපදේශන සේවා වියදම් පිලිවෙලින් රු.1,213,595 කින් , රු.1,394,218 කින් හා රු.3,479,225 කින් අඩු වීම මෙහෙයුම් වියදම අඩු වීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 මෙහෙයුම් සමාලොචනය

#### 2.2.1 කාර්යය සාධනය

-------------------

ආයතනයේ මූලික අරමුණ වන පළාත් සභා හා පළාත් පාලන ආයතන වල සභිකයින්, නිලධාරීන් හා සේවකයින්ට ඔවුන්ගේ රාජකාරි කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස ඉටු කිරීමට හැකි වන පරිදි වැඩමුළු හා පුහුණු පාඨමාලා පැවැත්වීමේ කාර්යය සඳහා සමාලෝචිත වර්ෂයේ රු.20,000,000 ක වෙන් කර තිබුණි. ඒ සඳහා සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ ඉලක්කගත වැඩසටහන් වලට අනුරූපීව කර තිබූ කාර්යය සාධන කටයුතු වලට අදාලව ඉදිරිපත් කර තිබූ විස්තර ප්‍රමාණවත් නොවූයෙන් ඉලක්කගත වැඩසටහන්වල සාර්ථකත්වය පිළිබඳ නිරීක්ෂණය කිරීමට නොහැකි වූ අතර, එහි ඇස්තමේන්තුගත හා තථ්‍යයන් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| අංශය | ඇස්තමේන්තුගත වැඩමුළු සංඛ්‍යාව | ඇස්තමේන්තුගත සහභාගිත්ව සංඛ්‍යාව | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන | තථ්‍ය වැඩමුළු සංඛ්‍යාව | සහභාගිත් ව සංඛ්‍යාව | තථ්‍ය වියදම |
|---|---|---|---|---|---|---|
| මානව සම්පත් | 16 | දක්වා නොතිබුණි. | 2,100,000 | 7 | 1788 | 1,789,146 |
| ඉංජිනේරු | 29 | 352 | 2,100,000 | 9 | 320 | 1,005,867 |
| පොදු කළමනාකරණ | 30 | දක්වා නොතිබුණි. | 2,100,000 | 16 | 848 | 1,516,663 |
| භෞතික සැලැසුම් | 18 | 640 | 2,100,000 | 10 | 491 | 1,238,311 |
| මූල්‍ය කළමනාකරණ | 50 | දක්වා නොතිබුණි. | 2,100,000 | 16 | ඉදිරිපත් කර නැත | 3,077,777 |
| නීති | 23 | 1065 | 2,100,000 | 17 | 954 | 1,377,320 |
| පර්යේෂණ | 10 | 480 | 2,100,000 | 7 | 453 | 1,169,460 |

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම අනුව මානව සම්පත් කළමනාකරණ අංශයෙ වැඩමුළු 16 ක් සඳහා රු. 2,100,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. ඒ අනුව එක් වැඩමුළුවක් සඳහා ඇස්තමේන්තු වියදම රු.131,250 ක් වුවද තථ්‍ය වියදම රු.255,592 ක් වී තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු පිරිවැයට සාපේක්ෂව තථ්‍ය වියදම 95% කින් වැඩි වී තිබුණි. තවද පැවැත්වීමට ඇස්තමේන්තු කර තිබූ වැඩමුළු 16 වෙනුවට 7 ක් පමණක් පවත්වා තිබුණි.

(ආ) පොදු කළමනාකරණ අංශයේද, රු. 2,100,000 ක් ඇස්තමේන්තු කර වැඩසටහන් 30 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද වැඩසටහන් 16 ක් පමණක් පවත්වා තිබුණි. තවද වැඩසටහනක ඇස්තමේන්තු වියදම රු.70,000 ක් වුවද තථ්‍ය වියදම

රු.94,791ක් විය. ඒ අනුව ඇස්තමේන්තු වියදමට සාපේක්ෂව තථ්‍ය වියදම 35% කින් වැඩි වී තිබුණි.

(ඇ) මූල්‍ය කළමණාකරන අංශය සඳහා ද ඩිප්ලෝමා පාඨමාලා 3 ක් හා වැඩසටහන් 13 ක් පැවැත්වීම සඳහා රු.2,100,000 ක් ඇස්තමේන්තු කර තිබුණද, ඩිප්ලෝමා පාඨමාලා 2 ක් හා වැඩසටහන් 12 ක් සඳහා තථ්‍ය වියදම රු. 3,077,777 ක් වීම නිසා ඇස්තමේන්තු වියදමට සාපේක්ෂ තථ්‍ය වියදමේ වැඩිවීම 46.5% ක් විය.

(ඈ) ඉංජිනේරු අංශය විසින් වැඩසටහන් 29 ක් පැවැත්වීමට සැලැසුම් කර වැඩසටහන් 9 ක් පමණක්ද, නීති අංශය විසින් වැඩසටහන් 23 ක් පැවැත්වීමට සැලැසුම් කර වැඩසටහන් 17 ක්ද පවත්වා තිබුණි. ඉංජිනේරු අංශයේ වැඩමුළු 29 ක් මගින් නිලධාරීන් 352 ක් පුහුණු කිරීමට සැලසුම් කර තිබුණද, වැඩමුළු 9 ක් මගින් නිලධාරීන් 320 ක් පුහුණු කර තිබුණි.

2.2.2 ආර්ථික නොවන ගනුදෙනු

(අ) ආයතනයට හිමිකාරීත්වය නොමැති කණ්ඩලම සංචාරක නිවාසයේ සේවක වැටුප් හා නඩත්තු කටයුතු සඳහා 2010 ජනවාරි සිට ජූලි දක්වා රු.409,583 වැය කර තිබු අතර ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා රු.213,300 ක වියදමක් දරා තිබු නමුත් 2010 වර්ෂයේ ආදායම රු.2,500 ක් විය.

(ආ) ආයතනය සඳහා මහල් 04 කින් යුතු ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී ගෘහ නිර්මාණ ශිල්පියෙකු වෙත රු.240,000 ක් ගෙවා තිබූ නමුත් මෙම ගොඩනැගිල්ල විගණිත දින වන විටත් ඉදි කරම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඇ) 2010 සැප්තැම්බර්/ඔක්තෝම්බර් මාස වල කුසලතා සංවර්ධනය පිළිබඳ දින 5 ක පුහුණු වැඩමුළුවක් (Skill Development Training Programme on GIS, GPS Remote Sensing) නවයාලතැන්න පුහුණු මධ්‍යස්ථානයේ පැවැත්වීමට සංවිධානය කර, එය අවලංගු කර තිබුණද එක් දිනක ආහාරපාන හා නවාතැන් ගාස්තු ලෙස රු.15,871 ක් පොල්ගොල්ල සමූපකාර සංවර්ධන ආයතනය වෙත ගෙවා තිබුණි.

2.2.3 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් ආයතනයේ සම්පත්

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ හා එහි විෂයය භාර අමාත්‍යවරයාගේ රාජකාරි සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබූ නිලධාරීන් සඳහා 2010 වර්ෂයේ දි රු.763,303 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවීම් කර තිබුණි.

2.2.4 ඌන උපයෝජිත වත්කම්

එකතු වටිනාකම රු.654,000 ක් ව විෂයන් 05 ක වත්කම් කාර්යාල පරිශ්‍රයයේ නිෂ්ක්‍රීයව තිබුණි.

2.2.5 හානි හා පාඩු

පහත සඳහන් කරුණ නිරීක්ෂණය විය.

(අ) 2008 ජුලි සිට දෙසැම්බර් දක්වා වු සේවා නියුක්ති භාර අරමුදල වෙත යැවිය යුතු හය මාසික වාර්තා / මුදල් ප්‍රමාද කිරීම නිසා, රු.13,157 ක අධිභාරයක් ගෙවා තිබුණි.

(ආ) ඉඩමක් මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී ස්ථිර තැන්පත් වල ආයෝජනය කර තිබූ රු.මිලියන 9කන් රු.මිලියන 3 ක ස්ථාවර තැන්පතුවක් 2010 මාර්තු 31 දින උපලබ්ධි කර 2010 නොවැම්බර් 01 දින තෙක් ජංගම ගිණුමේ තැබීමට ඉඩ හැර තිබූණි. එකී මුදල් කෙටිකාලීනව හෝ ආයෝජනය කිරීම කෙරෙහි සළකා බලා නොතිබුණි.

(ඇ) කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබූ සේවකයකු වෙත 2010 සැප්තැම්බර් මාසයේ අවස්ථා 2 කදී වැටුප් ගෙවීම නිසා රු.19,180 ක වැඩිපුර ගෙවීමක් නිරීක්ෂණය විය

2.2.6 සේවක මණ්ඩල කළමනාකරණය

(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි වෙනස්කම් නිරීක්ෂණය වු අතර, අනුමත සේවක සංඛ්‍යාව පවත්වා ගැනීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි.

| | අනුමත | තථ්‍ය | ඉක්මවීම/පුරප්පාඩු |
|---|---|---|---|
| මාණ්ඩලික | 10 | 11 | 01 |
| මාණ්ඩලික නොවන | 26 | 21 | (05) |
| සුළු සේවක | 07 | 10 | 03 |

(ආ) අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නීති උපදේශකවරියක බඳවා ගෙන තිබියදී, තවත් උපදේශකවරියක් වසරක කොන්ත්‍රාත් කාලයක් සඳහා බඳවා ගෙන තිබුණි. එකී උපදේශකවරියගේ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොවුණි. කෙසේ නමුත් සමාලෝචිත වර්ෂයේදී රු.320,000 ක වැටුපක් ගෙවා තිබුණි.

3. පද්ධති හා පාලන.

--------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) වාහන පාලනය
(ආ) ගෙවීම් වවුචර් හා මුදල් ලැබීම් පත්‍රිකා
(ඇ) වැඩ මුළු පැවැත්වීම.
(ඈ) තොග පාලනය
(ඉ) සේවක දීමනා ගෙවීම.
(ඊ) අභ්‍යන්තර විගණනය